# පෙරටුගාමී සමාජවාදී පක්ෂය - ශ්‍රී ලංකාව
# முன்னிலை சோஷலிஸ கட்சி - இலங்கை
# FRONTLINE SOCIALIST PARTY - SRILANKA


2024-01-31

ප්‍රවෘත්ති කර්තෘ
දිනමිණ
ලේක්හවුස් ආයතනය

**සාවද්‍ය ප්‍රවෘත්තියක් සම්බන්ධ නිවැරදි කිරීමක් පළ කරන ලෙස ඉල්ලීම**

මහත්මයාණෙනි,

අද(31) දින දිනමිණ පුවත්පතේ මුල් පිටුවේ, "සීසන් අවලංගු කළොත් දුම්රියට-ලංගමට ලාභ ලැබිය හැකියි!" යන සිරස්තලයෙන් පළ කළ ප්‍රවෘත්තිය සම්බන්ධවයි.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව සහෝදරයාගේ ඡායාරූපයක්ද සහිතව පළ කර ඇති මෙම ප්‍රවෘත්තියේ අන්තර්ගතය 6 වැනි පිටුවේ මුද්‍රණය කර ඇති අතර ඔහු විසින් එම ප්‍රකාශය සිදු කළ බවටද නිශ්චිතව සඳහන්කර ඇත. මෙම ප්‍රවෘත්තියට අදාළ මූලාශ්‍රය හෝ එය ලියූ මාධ්‍යවේදියාගේ නමද සඳහන්ව නැත. මෙවැනි පුවතක් පළ කිරීමට පෙර, අදාළ ප්‍රකාශය සිදු කළ බව කියන දුමින්ද නාගමුව සහෝදරයාගෙන් විමසීමක් කළ යුතු වුවත් එවැන්නක්ද සිදුකර නැත.

<u>මෙම ප්‍රවෘත්තිය සම්පූර්ණ අසත්‍යයක් බවද මෙවැනි අදහසක් පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව සහෝදරයා විසින් කිසිදු අවස්ථාවක ප්‍රකාශ කර නැති අතර එය, අප පක්ෂයේ මතය නොවේ.</u>

මෙරට පාසල් දරුවන් ඇතුළු ශිෂ්‍ය ප්‍රජාවටත්, රාජ්‍ය සේවකයන් ඇතුළු වැඩකරන ජනතාවටත් හිමි අයිතියක් ලෙස මාසික වාර ප්‍රවේශ පත්‍ර ඇතුළු සමාජ සුබසාධන අවලංගු කළ යුතු යැයි මතයක් අප පක්ෂය කිසිදු විට ප්‍රකාශකර නැත. <u>දිනමිණ පුවත්පතේ මුල් පිටුවේ ප්‍රසිද්ධ කරන මේ පුවත මගින් ප්‍රචාරය කරන්නේ, පවතින සුබසාධනයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් සටන් කරන පක්ෂයක් ලෙස අප පක්ෂයේ දේශපාලන ස්ථාවරයට සපුරා පටහැනි අදහසකි.</u>

මෙය කිසිදු අත්වැරදීමක් හෝ සාමාන්‍ය පුවතක් ලෙස සැළකිය නොහැකි වන්නේ එය ඡායාරූපයක් සහිතව පළමුවැනි පිටුවේ පළ කිරීමත්, පුවත ලියූ මාධ්‍යවේදියාගේ නම සටහන් නොකිරීම මෙන්ම පුවතට අදාළ මූලාශ්‍රය සටහන් නොකිරීම නිසාය.

ඒ අනුව ජනමාධ්‍ය අචාර ධර්ම අනුවද පිළිගත් සමාජ සදාචාරය අනුවද මෙවැනි අසත්‍ය ප්‍රකාශයක් ප්‍රසිද්ධ කිරීම මගින් <u>දිනමිණ පුවත්පත හා ලේක්හවුස් ආයතනය විසින් පෙරටුගාමී සමාජවාදී පක්ෂය සම්බන්ධයෙන් මෙන්ම පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව සහෝදරයා සම්බන්ධව බරපතළ ලෙස වැරදි චිත්‍රයක් පාඨකයන් වෙත ලබා දී ඇත.</u>

එම නිසා <u>මේ අසත්‍ය පුවත පළ කිරීම සම්බන්ධ කනගාටුව පළ කිරීමක් හා නිවැරදි කිරීමක් දිනමිණ පුවත්පතේ මුල් පිටුවේ පළ කරන ලෙස</u> කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි

චන්දන සිරිමල්වත්ත
මාධ්‍ය ඒකකය - පෙරටුගාමී සමාජවාදී පක්ෂය
පිටපත - ප්‍රධාන කර්තෘ - දිනමිණ


22/1, මෙල්ඩර් පෙදෙස, නුගේගොඩ, ශ්‍රී ලංකාව
22/ 1, Melder Place, Nugegoda, Sri Lanka.
Tel 011- 282 4198 Fax 071 880 3259 E mail - media.flsp@gmail.com Web - frontlinesp.org